**තිරසාර විදුලි බල අංශ සහාය ව්‍යාපෘතිය - 2015**

**---------------------------------------------------**

තිරසාර විදුලි බල අංශ සහාය ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2011 ජුනි 20 දින එළඹි අංක 2733 එස්ආර්අයි (එස්එෆ්) හා අංක 2734 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.05 (අ) සහ 4.03(අ) ව්‍යවස්ථා සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**---------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, විදුලි බල සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ 1 සිට 6 සහ 9 සිට 10 කොටස් සඳහා ලංකා විදුලි බල මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර 7 සහ 8 කොටස් සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, විශ්වාසදායී , ප්‍රමාණවත් සහ දැරිය හැකි විදුලි බල සැපයුම ආවරණය වන ප්‍රදේශය පුළුල් කිරීම සඳහා සහ (i) නැගෙනහිර, උතුරු මැද, දකුණු හා ඌව පළාත්වල සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම (ii) නැගෙනහිර හා ඌව පළාත්වල ග්‍රාමීය විදුලි සැපයුම පුළුල් කිරීම සහ (iii) බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ වැඩිදුර සංවර්ධනය මඟින් සේවා බෙදා හැරීමේදී කාර්යක්ෂමතාවය සහ විශ්වාසදායී බව වැඩිදියුණු කිරීමයි.

2010 ඔක්තෝබර් 06 දිනැති ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,135 කට සමාන එජඩො මිලියන 162.03 ක් වන අතර ඉන් සියයට 74 ක් නියෝජනය වන රු.මිලියන 13,427.64 කට සමාන එජඩො මිලියන 120 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. 2011 නොවැම්බර් 17 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2014 අප්‍රේල් 30 වන විට නිම කිරීමට සහ 2016 ඔක්තෝබර් 30 දිනට ණය අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**-------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය

ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.
(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

(ඒ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය

----------------------------------------

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන චක්‍රලේඛයට අනුව 2016 මාර්තු 16 දිනට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2016 අගෝස්තු 11 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පෙර වර්ෂ වලදී රු.මිලියන 48.99 ක පිරිවැයකට ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කර සමාලෝචිත වර්ෂය තුළ ලංකා විදුලි බල මණ්ඩලයට මාරු කරන ලද මෝටර් වාහන 7 ක් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල කෙරී ගෙන යන වැඩ ලෙස අඛණ්ඩව දක්වා තිබුණි. තවද පෙර වර්ෂවලදී ප්‍රසම්පාදනය කරන ලද වෙනත් මෝටර් වාහන 7 ක් සඳහා ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගෙවන ලද දේශීය ගාස්තු ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මෝටර් වාහන වල වටිනාකම රු.මිලියන 14.13 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ප්‍රතික්‍රියා විදුලිබල කළමනාකරණය (Reactive Power Management ) යටතේ රු.මිලියන 196.90 ක් වූ නිම කරන ලද වැඩ වටිනාකම වර්ගීකරණ දෝෂයක් හේතුවෙන් නව ගාල්ල විදුලි බල සමප්‍රේෂණ සංවර්ධන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි.

## 2.2.3 නොසැසඳු වෙනස්කම්

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අංක 2733 දරන ණය ගිවිසුම යටතේ රු.මිලියන 9,043 ක්වූ ණය වියපැහැදම විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යන වාර්තාවල දැක්වෙන රු.මිලියන 9,177.58 ක් වූ අනුරූපී ණය මුදල සමඟ සමානවී නොතිබුණු බව නිරික්ෂණය විය.

(ආ) ලංකා විදුලි බල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.මිලියන 2,067.67 ක් වූ සමාලෝචිත වර්ෂය තුළ විය පැහැදම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 1,789.22 ක් වූ වියපැහැදම සමඟ සමානවී නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | 118.07 | 13,223.84 | 1,863.00 | 12.60 | 1,789.00 | 70.40 | 9,999.00 |
| ශ්‍රීලංර | 42.03. | 4,707.36 | - | - | - | - | - |
| ලංවිම | - | - | 208.00 | 3.60 | 513.00 | 13.40 | 1,899.00 |
| | 160.10 | 17,931.20 | 2,071.00 | 16.20 | 2,302.00 | 83.80 | 11,898.00 |

## 3.2 භෞතික කාර්ය සාධනය

-----------------------------

ලබාගත හැකිවූ තොරතුරු අනුව, නව ගාල්ල විදුලි බල සම්ප්‍රේෂණය, ඊසාන විදුලිබල සම්ප්‍රේෂණය නැගෙනහිර පළාත් බෙදා හැරීම් ධාරිතාවය සංවර්ධනය හා මොරගොල්ල ජල විදුලි බල මධ්‍යස්ථානය සංවර්ධනයන් යටතේ වැඩ 2015 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි. කෙසේ වුවද කිරිබත්කුඹුර උපපොළ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම වැඩ ආරම්භ කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ආරම්භක අදියරයන්හි පැවතුණි. තවද නැගෙනහිර පළාතේ බෙදාහැරීම් ධාරිතා සංවර්ධන කාර්යය සඳහා විශේෂිත උපයෝගිතා වාහන ප්‍රසම්පාදනය කිරීමේ කටයුතු සැපයුම්කරුගේ දුර්වලතාවයන් හේතුවෙන් සම්පූර්ණ කර නොතිබුණි. ඌව පළාතේ හල්දුම්මුල්ල හා රාගල ප්‍රදේශවල මධ්‍යම වෝල්ටීයතා බෙදාහැරීම් පද්ධතිය ශක්තිමත් කිරීමේ කටයුතු ඉඩම් අත්පත් කර ගැනීමේ ආරාවුල් හේතුවෙන් සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි.

## 3.3 මතභේදයට තුඩුදෙන කරුණු

-------------------------------

කොන්ත්‍රාත්කරුවන් විසින් ගෙවන ලද රු.මිලියන 8.93 ක් වූ ආදායම් බදු, ණය ගිවිසුම්වල විශේෂ කොන්දේසි 1.10 වගන්තියට පටහැනිව ව්‍යාපෘතිය විසින් ප්‍රතිපූර්ණය කර තිබූ බව නිරීක්ෂණය විය.